රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
அரச கணக்குகள் திணைக்களம்
Department of State Accounts

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | දිනය<br>திகதி<br>Date 2019.10. 29 |

**රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක :- 270/2019**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානින් සහ

දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

<u>එකතු කළ අගය මත බදු ගිණුම්ගත කිරීම</u>

එකතු කළ අගය මත බදු ගිණුම්ගත කිරීම සඳහා රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ 2016/01/06 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 248/2016 ක්‍රියාත්මක කිරීමේදී ඇතැම් ආයතන එහි දක්වා ඇති ගිණුම් තැබීමට අදාළ උපදෙස් 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනතේ බදු ගණනය කිරීම්වලට අදාළ විධිවිධාන හා සම්බන්ධ කර නොගැනීම හේතුවෙන් යම් යම් ගැටළු පැනනැගී ඇති බව නිරීක්ෂණය විය.

විශේෂයෙන් මෙම චක්‍රලේඛය හඳුන්වාදීමේ අරමුණ වූයේ එකතු කළ අගය මත බදු පනතේ විධිවිධාන අනුව ගණනය කළ යෙදවුම් හා නිමවුම් බදු වටිනාකම ප්‍රධාන ලෙජර් ගිණුමක් හරහා ගිණුම්ගත කර වර්ෂය අවසානයේ දී තවදුරටත් ගෙවිය යුතු හෝ ඉදිරි වර්ෂවල දී හිලව් කරගැනීම සඳහා ඉදිරියට ගෙන යා හැකි ඉඩදෙනු ලබන යෙදවුම් බදු වටිනාකම අවසන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කිරීමය.

ඒ අනුව එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි වී ඇති අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් 2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනතේ ප්‍රතිපාදනයන්ට අනුව ඉඩදිය හැකි යෙදවුම් හා නිමවුම් බදු ගණනය කර පහත දැක්වෙන පරිදි වාර්ෂික මූල්‍ය ප්‍රකාශන යටතේ ගිණුම්ගත කළ යුතු ය.

1. එකතු කළ අගය මත වූ බදු ගිණුම්ගත කිරීම සඳහා අංක 9185 දරණ එකතු කළ අගය මත බදු පාලන ගිණුම පවත්වාගෙන යනු ලැබේ.

2. මෙම ගිණුමට එකතු කළ අගය මත බදු පනතේ දක්වා ඇති විධිවිධාන පරිදි ඉඩදිය හැකි යෙදවුම් බදු හර කළ යුතු අතර නිමවුම් බදු බැර කළ යුතු ය.

3. ඒ අනුව වියදම් ගිණුම්ගත කිරීමේදී ඉඩදෙනු ලබන යෙදවුම් බදු ප්‍රමාණය එකී වියදම් ගිණුමට අධිභාර කර ඉඩදෙනු ලැබූ යෙදවුම් බදු රහිත වියදම ගිණුම්ගත කළ යුතු ය. එසේ වුවද වැය විෂය අංක 2101 සිට 2108 දක්වා වූ මූල්‍ය නොවන වත්කම් අත්පත් කරගැනීම සඳහා වූ වියදම් දැරීමේ දී ඉඩදෙනු ලබන යෙදවුම් බදු ඉහත දැක්වූ පරිදි අදාළ වැය විෂයට අධිභාර කිරීම වෙනුවට ඉඩදෙනු ලබන යෙදවුම් බදු අඩු කළ වියදම අදාළ වැය විෂයට හර

මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව. பொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka.
General - Tel.: +94 11 2484500/600 Ext.: 1149 Fax : +94 11 2484869 Website : www.sad.gov.lk
Director General - Tel.: +94 11 2484728 Fax : +94 11 2473856 e -mail : dgsa@sad.treasury.gov.lk

කර ඉඩදෙනු ලබන යෙදවුම් බදු ප්‍රමාණය එකතු කළ අගය මත බදු සඳහා වූ පාලන ගිණුමට හර කළ යුතු ය. විශේෂයෙන් නව සිගාස් පරිගණක පද්ධතිය හරහා මූල්‍ය නොවන වත්කම් ගිණුම් තැබීමේදී අදාළ වැය විෂයන්ට සිදුකරනු ලබන අධිභාරයන් එහි වත්කම්හි අපහරණයන් ලෙස ගිණුම්ගත වන බැවින් මෙලෙස ඉඩදෙනු ලබන යෙදවුම් බදු එකී වැය විෂයන්ට අධිභාර කිරීමෙන් සිදුවිය හැකි ගිණුම්මය දෝෂයන් වළක්වා ගැනීම සඳහා මෙම ව්‍යාතිරේඛ ක්‍රමවේදය හඳුන්වාදී ඇත.

4. මාසිකව හෝ කාර්තු පදනමින් එකතු කළ අගය මත බදු ගෙවන අවස්ථාවලදී අදාළ කාලපරිච්ඡේදයේ ඉඩදෙනු ලබන යෙදවුම් බදු වටිනාකමට වඩා ගෙවිය යුතු නිමවුම් බදු වටිනාකම වැඩිනම් එකී වැඩි නිමවුම් බදු ප්‍රමාණය එකතු කළ අගය මත බදු පාලන ගිණුමට හර කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත පියවිය යුතු අතර ඉඩදෙනු ලබන නිමවුම් බදු වටිනාකම වැඩිනම් එම වටිනාකම ඊළඟ ගෙවීම් කාලපරිච්ඡේදය සඳහා ඉඩදිය හැකි යෙදවුම් බද්දේ කොටසක් ලෙස සළකා එකතු කළ අගය මත බදු පාලන ගිණුමේ ඉදිරියට ගෙන යා හැක.

ඒ අනුව 248/2016 අංක දරණ එකතු කළ අගය මත බදු ගිණුම්ගත කිරීම සඳහා වූ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය මෙයින් අවලංගු කරනු ලැබේ.

ආර්.එම්.ඒ. රත්නායක
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්:

01. විගණකාධිපති
02. දේශීය ආදායම් කොමසාරිස් } දැ.ගැ.ස.